# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,353 - 2023 ඔක්තෝබර් මස 06 වැනි සිකුරාදා - 2023.10.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම් ... ... ... | — |
| මුදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | 570 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2023 ඔක්තෝබර් මස 27 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2023 ඔක්තෝබර් මස 13 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**206 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය."

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2023 ජනවාරි මස 02 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය www.documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# විවිධ දැන්වීම්

**සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරමින් කොළඹ දී පවත්වනු ලබන බස්නාහිර පළාතේ මහාධිකරණයේ දී ය**

බොරලැස්ගමුව, කටුවාවල, පිළියන්දල පාරේ, අංක 61/1 දරන ස්ථානයේ පිහිටි මාස් ඒෂියා ඉන්වෙස්ට්මන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය පිළිබඳ කාරණයේ දී ය.

*සහ*

මාස් ඒෂියා ඉන්වෙස්ට්මන්ට්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් ආයතනය අධිකරණය විසින් ගණන් බේරා වසා දැමීම සඳහා 2007 අංක 7 දරන සමාගම් පනතේ විධිවිධාන සමග කියවිය යුතු එකී පනතේ 270 (ඉ) වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 272 වගන්තිය යටතේ වූ ඉල්ලීමක් පිළිබඳ කාරණයේ දී ය.

නඩු අංකය : CHC/63/2023/CO.

හේනාධිරගේ දෙන් ප්‍රදීප් උදයංග කුමාර,
අංක 101/3, සමගි මාවත,
බට්ටියවත්ත පාර,
බෝකුන්දර, පිළියන්දල.

..................*පෙත්සම්කරු.*

බස්නාහිර පළාතේ වාණිජ මහාධිකරණය විසින් ඉහත නම් සඳහන් සමාගම ගණන් බේරා වසා දැමීම පිණිස පෙත්සමක් 2023ක් වූ අගෝස්තු මස 31 වැනි දින එකී අධිකරණය වෙත පෙත්සම්කරු වෙනුවෙන් නීතිඥ ඩබ්ලිව්. එම්. ඩී. මලින්ද බණ්ඩාර වාසල ඉදිරිපත් කර ඇති බව ද, එකී පෙත්සම 2023.11.20 වැනි දින අධිකරණය ඉදිරියේ විභාග කරනු ලැබීමට නියම කර ඇති බව ද, එකී පෙත්සම මත නියෝගයක් කිරීම තහවුරු කිරීම හෝ විරුද්ධ වීමට කැමති එකී සමාගමේ ණයහිමියකු හෝ දයකයකු වේ නම් ඒ තැනැත්තා කාර්යය සඳහා එය විභාග කරන අවස්ථාවේ පෞද්ගලිකව හෝ තමාගේ නීතිඥවරයා මාර්ගයෙන් පෙනී සිටිය හැකි බව ද, පෙත්සමේ පිටපතක් අවශ්‍ය වන එකී සමාගමේ ඕනෑම ණයහිමියකුට හෝ දයකයකුට ඒ සඳහා නියමිත ගාස්තුව ගෙවූ විට පහත සඳහන් අය විසින් සපයනු ලබන බව ද මෙයින් දැනුම් දෙනු ලැබේ.

පෙත්සම්කරුගේ නීතිඥ,
ඩබ්ලිව්. එම්. ඩී. මලින්ද බන්ඩාර වාසල,
අංක 391, 4/2, 4 වන මහල, වේල්ල වීදිය,
කොළඹ 12.

එකී පෙත්සම විභාග කරන අවස්ථාවේ පෙනී සිටීමට කැමැති ඕනෑම තැනැත්තකු තමා විසින් එසේ කිරීමට අදහස් කරන බවට ලිඛිත දැන්වීමක් නීතිඥ ඩබ්ලිව්. එම්. ඩී. මලින්ද බණ්ඩාර වාසල වෙත භාර දිය යුතු ය. *නැතහොත්* ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. එම දැන්වීමේ එම තැනැත්තාගේ නම සහ ලිපිනය ද ව්‍යාපාර ආයතනයක් නම් ව්‍යාපාර ආයතනයේ නම ලිපිනය සඳහන් කළ යුතු අතර එය එකී තැනැත්තා හෝ ව්‍යාපාර ආයතනය විසින් හෝ ඔවුන්ගේ නීතිඥවරයෙකු වෙතොත් එම නීතිඥවරයා විසින් අත්සන් කළ යුතුවාක් මෙන්ම 2023.11.19 වැනි දින සවස 6.00 ට පෙර ලැබෙන්නට භාර දිය යුතු ය.

රෙජිස්ට්‍රාර්,
වාණිජ මහාධිකරණය,
කොළඹ.

10-44

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවත් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මඟින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

**සැළකිය යුතුයි.** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2023 වර්ෂය** | | | |
| **ඔක්තෝබර්** | 2023.10.06 | සිකුරාදා | 2023.09.22 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2023.10.13 | සිකුරාදා | 2023.09.27 | බදාදා | දහවල් | 12.00 |
| | 2023.10.20 | සිකුරාදා | 2023.10.06 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2023.10.27 | සිකුරාදා | 2023.10.13 | සිකුරාදා | දහවල් | 12.00 |
| **නොවැම්බර්** | 2023.11.03 | සිකුරාදා | 2023.10.20 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2023.11.10 | සිකුරාදා | 2023.10.27 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2023.11.17 | සිකුරාදා | 2023.11.03 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2023.11.24 | සිකුරාදා | 2023.11.10 | සිකුරාදා | දහවල් | 12.00 |
| **දෙසැම්බර්** | 2023.12.01 | සිකුරාදා | 2023.11.17 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2023.12.08 | සිකුරාදා | 2023.11.24 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2023.12.15 | සිකුරාදා | 2023.12.01 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2023.12.22 | සිකුරාදා | 2023.12.08 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2023.12.29 | සිකුරාදා | 2023.12.15 | සිකුරාදා | දහවල් | 12.00 |

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2023 ජනවාරි මස 02 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.